සංවාරක හා ඉඩම් අමාත්‍යාංශය (ඉඩම් අංශය)

ධාවනයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම සදහා මිල ගණන් කැඳවීම.

"මිහිකත මැදුර" ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල ලිපිනයේ පිහිටි සංවාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ඉඩම් අංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු වලට අයත්, පහත සදහන් ධාවනයෙන් ඉවත් කරන ලද වාහන/ වාහන සුන්බුන් විකිණීම සදහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වාහන අංකය හා වර්ගය | අයත් ආයතනය | වාහන පරීක්ෂා කළ හැකි ස්ථානය |
|---|---|---|---|
| | ධාවනයෙන් ඉවත් කරන ලද | | |
| 01 | KH-5691<br>මයික්‍රෝ කයිරන් ජීප් | සංවාරක හා ඉඩම් අමාත්‍යාංශය<br>විමසීම්: ජයතිලක මහතා,<br>ප්‍රවාහන නිලධාරී, 0707482855, 0112797500 | සංවාරක හා ඉඩම් අමාත්‍යාංශ පරිශ්‍රය |
| 02 | 53-0049<br>මිට්සුබිෂි ඩබල් කැබ් | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව<br>විමසීම්: දිසානායක මිය,<br>කොමසාරිස්(පාලන),0112797452<br>මියනදෙණිය මහතා, සහකාර කොමසාරිස් (පාලන), 0112797453 | |
| 03 | KH-5690<br>මයික්‍රෝ කයිරන් ජීප් | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව<br>විමසීම්: වල්පොල මහතා, ප්‍රවාහන නිලධාරී, 071-8133612 | |
| 04 | KH-5694<br>මයික්‍රෝ කයිරන් ජීප් | | |
| 05 | 71-0073<br>කුබොටා වූ විල් ට්‍රැක්ටර් | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව<br>විමසීම්: වල්පොල මහතා, ප්‍රවාහන නිලධාරී, 071-8133612 | පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය |
| | සුන්බුන් | | |
| 06 | 40-8230<br>ටාටා ලොරි | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව<br>විමසීම්: වල්පොල මහතා, ප්‍රවාහන නිලධාරී, 071-8133612 | ඉඩම් කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, බොරුපන පාර, රත්මලාන |

මෙම වාහන 2024.09.02 දින දක්වා සතියේ වැඩ කරන දිනවලදී පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ඉහත දක්වා ඇති ස්ථාන වලදී ඒ ඒ දෙපාර්තමේන්තුවලට අදාල නිලධාරීන්ගේ සෘජු අධික්ෂණය යටතේ පරීක්ෂා කර බැලිය හැකිය.

මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන ගැණුම්කරුවන් හට 2024.08.09 දින සිට 2024.09.02 දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ දී ආපසු නොගෙවනු ලබන ගාස්තු වශයෙන් එක් වාහනයක් සඳහා රු. 3,000/- ක මුදලක් අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා, ලබා ගන්නා රිසිට්පත ඉදිරිපත් කර, ලංසු ලේඛන ගණකාධිකාරී (සැපයීම්) වෙතින් ලබා ගත හැකිය. එසේ ලබා ගන්නා ලංසු ලේඛන වල පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, එක් එක් වාහනය සඳහා වෙන වෙනම ලංසු ලේඛන ඉදිරිපත් කළ යුතුය. 2024.09.03 දින පෙ.ව. 10.30 ට තෙවන මහලේ පිහිටි අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේදී ලංසු විවෘත කරනු ලැබේ.

මිල ගණන් ඉදිරිපත් කිරීමේදී එක් එක් මෝටර් වාහනය සඳහා රු. 10,000/- ක ආපසු ගෙවන තැන්පතුවක් ද අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා ඒ සඳහා ලබා ගන්නා රිසිට්පත් සමග මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

ඔබගේ මිල ගණන් සඳහන් කරන ලද ලංසු ලේඛන ලිපි කවරයක බහා මුද්‍රා තබා, එහි වම්පස ඉහල කෙලවරෙහි " වාහන අපහරණය 2024 - සංවාරක හා ඉඩම් අමාත්‍යාංශය (ඉඩම් අංශය)" යනුවෙන් පැහැදිලිව සඳහන් කර ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කරන වාහන අංකයද සඳහන් කර 2024.09.03 දින පෙ.ව. 10.30 ට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවීම හෝ එම ලිපිනයේ තුන්වන මහලේ පිහිටි සංවාරක හා ඉඩම් අමාත්‍යාංශයේ (ඉඩම් අංශය) ප්‍රධාන ගණකාධිකාරී කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් ඉදිරිපත් කළ අයට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයකුට මිල ගණන් විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය. මෙම ටෙන්ඩරය සම්බන්ධයෙන් අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති
අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුව
සංවාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහ ලේකම් කාර්යාලය
නො. 1200/6, රජමල්වත්ත පටුමග
බත්තරමුල්ල

CamScanner